# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2013 ජූලි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 ජූලි මස 12 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 2.50 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

# 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2013 ජූලි මස 12 වන දින]

එල්.ඩී.—ඕ. 31/2013.

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ තේරීපත් වූ පළාත් පාලන ආයතනවල නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හෝ සභිකයකුගේ ධුරයෙහි පුරප්පාඩු පිරවීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

**2.** 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ක්‍රියාත්මකව පැවති, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන යටතේ යම් පළාත් පාලන ආයතනයක් සඳහා තේරීපත් වූ නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හෝ සභිකයකුගේ ධුරයෙහි පුරප්පාඩුවක් පිරවීමේ කාර්ය සඳහා, 2012 අංක 22 දරන පනතින් අදාළ විධිවිධාන ඉවත් කිරීම් හෝ සංශෝධනය කිරීම් තිබුණ ද, ඒ නොතකා ඒ පුරප්පාඩු පිරවීමේ දී සහ ඒ සම්බන්ධයෙන් එකී ආඥා පනතේ විධිවිධාන අදාළ කරගනු ලැබිය යුතු ය:

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ තේරීපත් වූ නගරාධිපති ආදී ධුරවල පුරප්පාඩු පිරවීම.

එසේ වුව ද, 2012 අංක 22 දරන පනතින් එකී ආඥාපනතට ඇතුළත් කරන ලද 66ආ වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කොට ඇති අවස්ථානුගත කරුණු යටතේ නගරාධිපති ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, එවිට, ඒ සම්බන්ධයෙන් ඒ උපවගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

**3.** මේ පනතේ විධිවිධාන මේ පනත ආරම්භවන දිනයේ සිට වසර හතරක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මකව පැවතිය යුතු ය.

පනත ක්‍රියාත්මක වන කාලසීමාව.

**4.** 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ආරම්භවන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ක්‍රියාත්මකව පැවැති, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන

වලංගු කිරීම.

2—PL 007409 -3,340 (2013/07)

ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන යටතේ පුරවන ලද නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හෝ සභිකයකුගේ ධුරයේ යම් පුරප්පාඩුවක් වලංගු ලෙස පුරවනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථනිරූපණය.

**5.** මේ පනතේ —

"නියෝජ්‍ය නගරාධිපති" යන්නෙන්, මහා නගර සභාවක නියෝජ්‍ය නගරාධිපති හෝ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක උප සභාපතිවරයා අදහස් වේ; සහ

"නගරාධිපති" යන්නෙන්, මහා නගර සභාවක නගරාධිපතිවරයා හෝ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.